# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2354/25 – 2023 ඔක්තෝබර් මස 19 වැනි බ්‍රහස්පතින්දා – 2023.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/150.

**කාර්මික ආරාවුල් පනත – 131 වැනි අධිකාරය**

අංක 2346/48 දරන හා 2023.08.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය, දළුගම, පරණ නුවර පාර, අංක 275/1 හි පදිංචි යමුනා විනෝදනී ද අල්විස් මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, නිදහස් චතුරස්‍රය හි පිහිටි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 47/2019 දරන හා 2023.07.20 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

ඒ හෙයින් අංක A 47/2019 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.08.24 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**පළමුවන උපලේඛනය**

''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2023 සැප්තැම්බර් මස 21 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2023. 08. 24 දිනැති අංක 2346/48 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද්දාවූ ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ යමුනා විනෝදනී ද අල්විස් මිය බැඳී සිටින්නාවූ ද 2023. 07. 20 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*පිටපත (අනෙක් පාර්ශ්වය)* ;

යමුනා විනෝදනී ද අල්විස් මිය, අංක 275/1, පරණ නුවර පාර, දළුගම, කැලණිය.

01. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න.)

02. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 10 - 0197

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.